# පවුල් සංස්ථාවේ අභිවෘද්ධිය පිණිස සප්ත අපරිහානීය ධර්මයන්ගේ උපයෝගිත්වය පිළිබඳ අධ්‍යයනයක්; සාරන්දද සූත්‍රය ඇසුරින්

දෙල්දූවේ ඤාණසුමන[1]

## හැඳින්වීම

බුදුරජාණන් වහන්සේ ශ්‍රී මුඛයෙන් දේශනා කරන්ට යෙදුණා වූ සමස්ත ධර්මය සංගීතිකාරක තෙරවරුන් වහන්සේලා විසින් පිටකත්‍රයක්හි ලා සංග්‍රහ කොට තිබේ. සූත්‍ර, විනය, අභිධර්ම යනු එම ත්‍රිපිටකයයි. සූත්‍ර පිටකයෙහි නිකාය පහෙන් සිව්වැනි පිටකය වන අංගුත්තර නිකාය තුළ අන්තර්ගත සාරන්දද සූත්‍රය සප්ත අපරිහානීය ධර්ම පිළිබඳ දේශනා කරන්නට යෙදුණා වූ සූත්‍ර දේශනාවකි. සාරන්දද සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ මුළු මහත් සමාජයට ම පෙන්වා දෙන්නට යෙදුණු සප්ත අපරිහානීය ධර්ම වර්තමාන සමාජය තුළ ද අතීතයේ භාවිත කළ ආකාරයට භාවිත කිරීම සමාජ යහපැවැත්මට මෙන් ම පවුල් සංස්ථාවේ අභිවෘද්ධිය උදෙසා ද උපකාරී වෙයි. සමාජය තුළ කුඩා ම ඒකකය පවුල වන අතර එය කුඩා රාජ්‍යයක් යැයි කිව හොත් නිවැරදි ය. පවුල යන මෙම කුඩා රාජධානිය සාමයෙන්, සමගියෙන් පවත්වා ගැනීම ඉතා වැදගත් කරුණක් බව විද්‍යාමාන කරුණකි. අතීතයේ බුදුරජාණන් වහන්සේ වැඩ සිටි කාල වකවානුව තුළ දී මෙම ධර්ම කරුණු පෝරාණ වජ්ජි ධර්ම යැයි හඳුන්වනු ලැබූහ. එයට හේතුව නම් ලිච්ඡවී රාජ්‍ය තුළ මෙම ධර්මය පිළිපැදීමයි. මෙම රජ, මැති, ඇමැතිවරුනට බොහෝ උපකාරී වූ පුරාණ ධර්ම කාරණා හත පවුල් සංස්ථාවේ යහපත සඳහා උපකාරී වෙයි ද? යන වග විමසීම මෙහි ලා පර්යේෂණ ගැටලුවයි. සප්ත අපරිහානීය ධර්ම කාරණා උපයෝගී කොටගෙන සාමයෙන්, සතුටින් පිරි පවුල් සංස්ථාවක් ගොඩනංවා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණ වෙයි. මෙම පර්යේෂණය සිදු කිරීම තුළින් යහපත් පවුල් ජීවිතයක් ගත කරන ආකාරය පිළිබඳ කරුණු සප්ත අපරිහානීය ධර්මය තුළ කෙලෙස විද්‍යාමාන වන්නේ ද යන වග මෙම පර්යේෂණයේ වැදගත්කම වන අතර අංගුත්තර නිකායාගත සාරන්දද සූත්‍රය තුළ විද්‍යාමාන කරුණු කාරණා තුළට පමණක් සීමා වී මෙම පර්යේෂණය සිදු කරනු ලැබේ.

සප්ත අපරිහානීය ධර්ම පිළිබඳ ව මූලික වශයෙන් මහා පරිනිබ්බාන සූත්‍රය, අංගුත්තර නිකාය අටුවාව, සාරන්දද සූත්‍රය ආදී වූ සූත්‍ර සහ අටුවා තුළ දක්නට ලැබේ. මෙකී සප්ත අපරිහානීය ධර්ම පිළිබඳ ව විවිධ විද්වතුන් විසින් කරන ලද අධ්‍යයන විද්‍යාමාන වේ. ගෝනලගොඩ නන්ද හිමි බෞද්ධ දේශපාලන ආචාරධර්ම පිළිබඳ ප්‍රාමාණික අධ්‍යයනයක් යන ප්‍රස්තුතය මූලික කොට ගනිමින් සප්ත අපරිහානීය ධර්ම තුළින් හෙළිවන දේශපාලන ආචාර ධර්ම පිළිබඳ ව ප්‍රාමාණික අධ්‍යයනයක් සිදුකොට තිබේ. (නන්ද හිමි, ගෝනලගොඩ, දේශපාලන ආචාර ධර්ම පිළිබඳ ප්‍රාමාණික අධ්‍යයනයක්,

1. විද්‍යෝදය පිරිවෙණ, කොළඹ 10, 01000, ශ්‍රී ලංකාව.
gnanasumanadelduwe@gmail.com

මහාචාර්ය පූජ්‍ය වරදිවෙල විජේසුමන ස්වාමීන්ද්‍ර අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය, 162 පිට.) සප්ත අපරිහානීය ධර්ම තුළින් හෙළිවන මූලික දේශපාලන වැදගත්කම, සහජීවනය උදෙසා සප්ත අපරිහානීය ධර්ම පිළිපදින්නේ කෙසේදැයි ප්‍රාමාණික අධ්‍යයනයක් සිදු කොට තිබේ. (ධම්මින්ද හිමි, සියඹලාගොඩ, (2017), අපරිහානීය ධර්ම හා සහජීවනය, බුදුසරණ පුවත්පත, අන්තර්ජාල කලාපය) සප්ත අපරිනානීය ධර්ම පිළිබඳ ව සංක්ෂිප්ත විවරණයක් ද දක්නට ලැබේ. (අරියවිමල හිමි, කොස්වත්තේ. (2018). බුද්ධ ධර්මය. 1 වන මුද්‍රණය. කොළඹ:10. සමයවර්ධන ප්‍රකාශන.) මෙහිලා දක්වන්ට යෙදුණේ මෙකී පර්යේෂණයට අදාළ සාහිත්‍ය විමර්ශනයයි.

**ක්‍රමවේදය**

මෙහි දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරන ලද අතර සාහිත්‍යයික මූලාශ්‍රය මුල් කොටගත් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය කෙරෙහි අවධානය යොමු කෙරිණි. මෙම අධ්‍යයනයේ දී ප්‍රාථමික මූලාශ්‍රය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී.

**ප්‍රතිඵල, සොයාගැනීම් සහ සාකච්ඡාව**

මෙම පර්යේෂණයේ ප්‍රතිඵල මත පදනම් ව විමසීමේ දී පවුල් සංස්ථාව තුළ පැන නගින අර්බුද විසඳා ගැනීමට මෙකී අපරිහානීය ධර්ම බොහෝ සේ වැදගත් බව විද්‍යමාන වන කරුණකි. වර්තමාන පවුල් සංස්ථාවේ අභිවර්ධනය උදෙසා මෙම ධර්ම කාරණා උපයෝගී කරගන්නේ කෙලෙස ද යන්න මෙහි ලා විද්‍යමාන කරුණකි. සප්ත අපරිහානීය ධර්මය තුළින් ගැනෙන පළමු කාරණය වන්නේ නිතර රැස්වීමයි. නිවස තුළ සමගිය අපේක්ෂා කරන්නේ නම් නිවසේ වෙසෙන සෑම පුද්ගලයා ම එකට එකතු විය යුතු ය. වර්තමානයේ හුදෙකලා වාසය කරන්නට ප්‍රිය වීම, කතාබහකින් තොර වීම නිසා බොහෝ ගැටලු පවුල් සංස්ථාව තුළ නිර්මාණය වෙයි. එකී ගැටලු බොහෝ සුවිසල් අර්බුද පැන නැගීමට පවා හේතුවක් වෙයි. අන්තර්ජාල භාවිතය නිසා බොහෝ පිරිස් තනි තනියම කාලය ගත කිරීමට පෙළඹී තිබේ. අතීතයේ ජීවත් වූ මිනිස්සු අනෙකාගේ ගති ලක්ෂණ සිරිත්විරිත් සිතුම් පැතුම්, තේරුම් ගත්හ. වර්තමානය තරම් බොහෝ සේ දියුණු තත්ත්වයකට පත් සමාජ පසුබිමක් අතීතයේ නො තිබුණ මුත් ඔවුහු ඉතා යහපත් සන්නිවේදන මාර්ගයක් පවත්වා ගත්හ. නිතර හමු වීම අඩුවන තරමට පවුල් සංස්ථාවේ බොහෝ ගැටලු නිර්මාණය වෙයි. එකිනෙකා කෙරෙහි සැකය අවිශ්වාසය නිතර රැස්වීමක් නොමැති විට වැඩි වෙයි. අනිකාට ඇහුම්කන් දීමට පුරුදු ව නො සිටින නිසා ද, හිත තුළ කැකෑරෙන සැකය නිසා ද පවුල් සංස්ථාව ඇතුළත තිබෙන වැටහීමත් අවබෝධයත් ඈත් වී යයි. විවාහ ජීවිතය ගත කරන විට බොහෝ කාර්ය බහුල වීම සැබෑ කරුණකි. සැමියා, බිරිඳ, දූ දරුවන් වශයෙන් එකිනෙකා හා එකදු වචනයකුදු කතා නොකිරීම තුළින් සමගිය බිඳී යයි. එලෙස සමගිය විනාශ වීමට නොදී සත්‍ය වචන භාවිතය තුළින් තම තමන්ගේ වැරදි අඩුපාඩු පාපෝච්චාරණය කර එකී වැරදි නිවැරදි කරගත යුතු ය. තම තමන්ගේ අදහස් ඉදිරිපත් කළ යුතු ය. කතාබහ කරන මාතෘකාවෙන් පිට කිසිවක් නොපවසා නිතර නිතර තම සමගිය රැකගැනීමට පිළියම් යොදමින් තම පවුල තුළ පවත්නා වූ සමගිය ආරක්ෂා කර ගැනීමට නිරන්තරයෙන් සමගි ව රැස්ව සමගියෙන් ක්‍රියා කොට සමගියෙන් විසිර යා යුතු ය.

වැඩිහිටියන්ට ගෞරවය දැක්වීම ඔවුන් විසින් ලබා දෙන අවවාද හිස් මුදුනින් පිළිගැනීම පවුල් සංස්ථාව තුළ දී කළ යුතු වැදගත් ම කරුණකි. මව්පියන්ට සැලකීම ඔවුන් රැකගැනීම සිදුකළ යුතු ය. යම් යම් අවස්ථාවල දී වැඩිහිටියන් නොයෙක් කරුණු අරභයා ලබාදෙන යහපත් අවවාද ලබා ඒ පවසන ආකාරයට ම ඒවා ක්‍රියාවට නැංවිය යුතු යි.

කාන්තාවන්ට ගෞරවය දැක්වීම ඊළඟ කාරණාව වෙයි. වර්තමාන සමාජයේ ඇතැම් කාන්තාවන්ට බොහෝ සමාජ අතවරයන්ට මුහුණ දීමට සිදු ව තිබෙන බව අසන්නට ලැබේ. අතීතයේ දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා ආභරණ පැළඳුවා වූ සුන්දර කාන්තාවක් පැමිණිය ද ඇය ට කිසිදු හානියක් නොවන බව පැවසේ වර්තමාන සමාජය ඊට හාත්පසින් වෙනස් වී තිබේ. කාන්තාවන්ට ගෞරවය දැක්විය යුතු බව සප්ත අපරිහානීය ධර්ම තුළින් පෙන්වා දී තිබෙන්නේ එම කරුණු ක්‍රියාවට නැංවීම තුළින් යම් යහපතක් වන නිසා ය. නිවස තුළ ද බොහෝ විට කාන්තා හිංසනය වැඩි වී තිබෙන බව අසන්නට ලැබේ. පියා විසින් දරුවන් ඉදිරියේ මවට දෝෂාරෝපණය සිදු කරනවා නම් එය අසා සිටින දරුවා කිසිදු මොහොතක මව විසින් ලබා දෙන අවවාද අනුශාසනා නො පිළිගනී. ඊට හේතුව දරුවා මව කෙරෙහි කිසිදු ගරුසරුවක් නැති පහත් මානසික ආකල්ප දරණ නිසා ය.

සප්ත අපරිහානීය ධර්ම කරුණු අතුරින් ඊළඟ කරුණ නම් නොපැන වූ නීති නොපැනවීමත් පැන වූ නීති ආරක්ෂා කිරීමත් වේ. පවුල් ජීවිතය ගත කරන විට කිසිම මොහොතක තමන්ගේ ඒකමතික තීරණ තුළින් කිසිවක් සිදු නො කළ යුතු ය. සියලු දෙනාගේ අනුදැනුම ඇතුව නීති පැනවීම සිදුකළ යුතු ය. තම පවුල් සංස්ථාව ඇතුළත පනවන්නට යෙදුණ නීති කිසිම අවස්ථාවක කඩ නොකළ යුතු ය. තම තමන් සිතන පරිදි නව නීති පනවන්නට ගිය හොත් පවුලේ ඇති සමගිය අන්‍යෝන්‍ය සුහදත්වය බිඳී විසිර යති.

පූජනීය ස්ථාන රැකගැනීම හා භික්ෂූන් උදෙසා ගරු බුහුමන් දැක්වීම සම්බන්ධයෙන් ඊළඟ කරුණු ද්වය දැක් වේ. යහපත් පවුල් සංස්ථාවක් ගොඩනගා ගැනීමට පොහොය දින හෝ හැකි සෑම දිනක ම විහාරස්ථාන කරා ගොස් ආගමානුකූල යහපත් කටයුතුවල නිරත විය යුතු වෙයි. ලිච්ඡවී රජවරු එකල බොහෝ පූජනීය ආරාම ඇසුරු කරමින් දන් පිරිනමමින් දැහැමි ලෙස තම රාජ්‍ය කටයුතු සිදු කළහ. පූජනීය ස්ථාන අභාවයට යෑම වළකා ගත යුතු ය. ඊට හේතුව නම් පූජනීය ස්ථාන අභාවයට යන විට ආධ්‍යාත්මික සංවර්ධනය උදෙසා මාර්ගෝපදේශ ලබා ගැනීම සඳහා භික්ෂූන් වහන්සේලා නොමැති වීම යි. පූජ්‍ය පක්ෂය ඇසුරු කරන විට එතුමන්ලාගේ ද ගෞරවය රැකෙන පරිදි ආශ්‍රය කළ යුතු අතර පවුල් ජීවිතය යහපත් ලෙස සංවර්ධනය කර ගැනීම සඳහා පැවිදි උතුමන්ගේ අවවාද අනුශාසනා ලබාගත යුතු ය.

**නිගමනය**

සප්ත අපරිහානීය ධර්ම ආරක්ෂා කරන කල පවුල් ජීවිතයේ එදිනෙදා ඇතිවෙන ගැටුම් බොහෝමයක් නිරාකරණය කර ගැනීමට හැකියාවක් පවතින අතර පවුල තුළ දිනෙන් දින මානසික සුවයෙන් පිරි නිදහස් පවුල් පසුබිමක් නිර්මාණය වන බව පර්යේෂණයෙන් එළැඹි නිගමනය යි.

**මුඛ්‍ය පදඃ පවුල් සංස්ථාව, බුද්ධ දේශනා, ලිච්ඡවී ධර්ම, සප්ත අපරිහානීය ධර්ම**

**ආශ්‍රිත ග්‍රන්ථ**

අරියවිමල හිමි, කොස්වත්තේ. (2018). *බුද්ධ ධර්මය*. 1 වන මුද්‍රණය. කොළඹ 10ඃ සමයවර්ධන ප්‍රකාශන.

*අංගුත්තර නිකාය*; සාරන්දද සූත්‍රය. Nirvana, P. (2018). Chattha Sangayana Tipitaka. [online] tipitaka.app. Available at: https://tipitaka.app [Accessed 15 Sep. 2024].